11–99/1

යොමු අංකය : ව/පස/2/1/19.

## වයඹ පළාත් සභාව

### වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 09 දරන වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 1992.12.29 වැනි දින සම්මත කරන ලදුව 1993.09.29 වැනි දින ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළුදෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

සම්පත් එම්. දසනායක,
ලේකම්,
වයඹ පළාත් සභාව.

1993 ඔක්තෝබර් මස 13 වැනි දින,
කුරුණෑගල,
වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

### වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 09 දරන වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය

වයඹ පළාතේ, පළාත් සභාව සතු යන්ත්‍රෝපකරණ වලින් උපරිම මට්ටමින් ප්‍රයෝජන ගැනීමට, එම යන්ත්‍රෝපකරණ ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගෙන යාමට හා ගුණාත්මක භාවයෙන් සේවා කටයුතු ඉටු කිරීමට වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිහිටුවීම සඳහා ද, ඊට අනුබද්ධ හෝ ආනුෂංගික හෝ වූ කරුණු පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා ද පනවනු ලබන ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

කෙටි නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ 1992 අංක 09 දරන වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනක සිට ක්‍රියාත්මක වන්නේ ය.

### *I වැනි කොටස*

*වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරියේ සංයුතිය, අරමුණු, බලතල හා කාර්යයන්*

වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිහිටුවීම.

2. මෙම ප්‍රඥප්තියෙහි විධිවිධාන වලට අනුකූලව මින්මතු අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය යනුවෙන් නම් කෙරෙන අධිකාරියක් මෙයින් පිහිටුවනු ලැබේ.

අධිකාරිය ස්ථාපිත ආයතනයක් වීම.

3. අධිකාරියට දී ඇති නාමයෙන් එම අධිකාරිය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත ආයතනයක් වන අතර, එම නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම ද, අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

4. (අ) රජය විසින් පළාත් සභාව වෙත පවරා දෙන ලද ඉඩකඩම්, ගොඩනැගිලි, වාහන, යන්ත්‍රෝපකරණ හා අන් සියලු නිශ්චල වූත්, චංචල වූත් දේපල අයිතිය භාර ගැනීම හා පරිහරණය කිරීම හා මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා එකී දේපල උපයෝගී කර ගැනීම ද, — අධිකාරියේ අරමුණු.

(ආ) අධිකාරිය සතු යන්ත්‍රෝපකරණ, වාහන හෝ වෙන යම් උපකරණ අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සේවා කිරීම සඳහා ද, යම් දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක් හෝ පෞද්ගලික අංශය සතු යන්ත්‍රෝපකරණ, වාහන හා වෙනයම් උපකරණ අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සේවා කිරීම භාර ගැනීම ද, අධිකාරිය සතු යන්ත්‍රෝපකරණ හා වාහන අනුමත නඩත්තු ගාස්තු යටතේ දෙපාර්තමේන්තු, සංස්ථා හා පෞද්ගලික ආයතනවලට හා පුද්ගලයින්ට දීම ද, අධිකාරියේ අරමුණු වේ.

5. හතරවන වගන්තියේ සඳහන් කරුණක් හෝ සියලු කරුණු හෝ සම්බන්ධයෙන් නැතහොත් අමාත්‍යවරයා විසින් අධිකාරිය වෙත යොමු කරනු ලබන අදාළ වෙනත් කරුණක් සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයාට උපදෙස් දීම අධිකාරයේ වගකීම වන්නේ ය. — අමාත්‍යවරයාට උපදෙස් දීම.

6. පහත සඳහන් බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අධිකාරයට බලය ඇත්තේය. එනම් — — අධිකාරියේ බලතල හා කාර්යයන්.

(අ) පළාත් සභාවේ යම් සංවර්ධන වැඩ සටහනක අඩංගු නිර්මාණ හෝ යාන්ත්‍රික කාර්යයන් සැලසුම් කිරීම, උපදෙස් හා තාක්ෂණික සහය ලබාදීම ;

(ආ) එම නිර්මාණ හෝ යාන්ත්‍රික කාර්යයන් සඳහා පිළියෙල කරන ලද සැලැස්මක් හෝ සැලසුම්කරණය පිළිබඳ උපදෙස් දීම ;

(ඇ) අධිකාරිය වෙත භාර දෙන ලද කාර්යයන් සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම හෝ ඇස්තමේන්තු පිළියෙල කරවීම ;

(ඈ) අධිකාරියට අවශ්‍ය චංචල හා නිශ්චල දේපල අත්පත් කර ගැනීම, කුලියට ගැනීම, බද්දට ගැනීම සහ මිලදී ගැනීම හා නඩත්තු කිරීම ;

(ඉ) අධිකාරිය සතු, අධිකාරියේ කාර්යයන් සඳහා උපයෝගී කරගත නොහැකි දේපල, ගොඩනැගිලි, අබලි ද්‍රව්‍ය හා ගර්හිත යන්ත්‍ර හා වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ;

(ඊ) අවශ්‍ය පරිදි රක්ෂණ ගිවිසුම්වලට බැඳීම,

(උ) අමාත්‍යවරයාගේ අභිමතය පරිදි විශේෂ අවස්ථාවලදී රාජ්‍ය හෝ රාජ්‍ය නොවන පොදු කාර්යයන් නඩත්තු ගාස්තු වලින් තොරව ඉටුකර දීමද, අධිකාරියේ කාර්ය මණ්ඩලයේ සුබසාධක කටයුතු සඳහා වියදම් දැරීම ද වේ.

## II කොටස

### අධ්‍යක්ෂ මණ්ඩලය

7. මෙහි මින් මතු "මණ්ඩලය," යනුවෙන් හඳුන්වන ලබන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පස් දෙනෙකුගෙන් සමන්විත යුතු අතර, එම මණ්ඩලය නිල සාමාජිකයින් තිදෙනෙකුගෙන් ද, නම් කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙකුගෙන් ද සමන්විත යුතු ය. — අධ්‍යක්ෂ මණ්ඩලය හා එහි සංයුතිය

(1) නිල සාමාජිකයන් තිදෙනා ප්‍රධාන ලේකම් ගේ නියෝජිතයෙක්, විෂය භාර අමාත්‍යංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙක් හා වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙක් ද වේ.

(2) නම් කරනු ලැබෙන සාමාජිකයින් දෙදෙනා අමාත්‍යවරයා විසින් සිය අභිමතය පරිදි පත් කරනු ලබන අතර, ඉන් එක් සාමාජිකයෙකු යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ අවුරුදු දහයකට නො අඩු පළපුරුද්දක් ඇති අයෙකු විය යුතු ය.

8. (1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ මහ නගර සභා හෝ නගර සභා හෝ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු හෝ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරනු නො ලැබිය යුතු ය. — නුසුදුසුකම්.

(2) විකල් සිහියෙන් යුතු පුද්ගලයෙකු හෝ බංකලොත් හෝ වස්තු භංගත්වයට පත් වූවකු බව ප්‍රකාශයට පත් කරන ලද පුද්ගලයෙකු හෝ කවර අන්දමකින් හෝ විස්තර කරන සිර දඬුවමකට පත්කල හැකි වරදක් කරන ලද බවට අධිකරණයෙන් විනිශ්චය කරනු ලැබූ පුද්ගලයෙකු මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරනු නො ලැබිය යුතු ය.

9. කවර කරුණක් නිසා හෝ ධුරය දැරීම කලින් අවසන් වුවහොත් හැර නම් කළ සාමාජිකයන් අවුරුදු තුනක කාලයකට සිය ධුරය දරනු ලබන්නේ ය. — නම් කල සාමාජිකයන්ගේ ධුර කාලය.

වැඩ බලන සාමාජිකයෙකු පත් කිරීම.

10. අසනීප නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ සිය රාජකාරී ඉටු කිරීමට නම්කළ සාමාජිකයා අපොහොසත් වේ නම්, [illegible] යටත්ව අමාත්‍යවරයා විසින් සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමට වෙනත් සුදුසු අයෙකු පත් කළ හැක්කේ ය.

නම් කළ සාමාජිකයා ඉල්ලා අස්වීම සහ ඉවත් කිරීම.

11. (1) අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් නම් කළ සාමාජිකයාට තම ධුරයෙන් ඉල්ලා අස් විය හැකිය.

(2) උචිත යයි අමාත්‍යවරයාට හැඟී යන්නේ නම්, නම්කළ සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කළ හැකිය.

සාමාජිකයා නැවත පත් කිරීම.

12. කාලය ඉකුත් වීමෙන් ධුරයෙන් ඉවත් වන නම් කළ සාමාජිකයෙකු නැවත පත් කළ හැකිය.

මණ්ඩලයේ සභාපති.

13. (1) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් එක් අයෙකු සභාපති ලෙස පත් කළ යුතු ය.

(2) සභාපතිවරයාට ස්වකීය කාර්යයන් ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක වැඩ බලන සභාපතිවරයෙකු අමාත්‍යවරයා විසින් පත් කළ හැක්කේ ය.

(3) මණ්ඩලයේ රැස්වීමකදී යම් කරුණක් පිළිබඳව කැමැත්ත විමසීමේදී පක්ෂ හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සම වේ නම්, මුලසුන දරන සභාපතිවරයාට තීරක ඡන්දයක් හිමි විය යුත්තේ ය.

මණ්ඩල රැස්වීම්.

14. (1) මණ්ඩලය මසකට වරක් හෝ රැස්විය යුතුය. මෙම රැස්වීම්වල මූලාසනය සභාපති විසින් දැරිය යුතු ය.

(2) සෑම මණ්ඩල රැස්වීමක්ම පිළිබඳ ලිඛිත දැනවීමක් එක් එක් සාමාජිකයාට රැස්වීම් දිනට දින හතකට පෙර ලැබෙන්නට සැලැස්විය යුතු අතර, එම රැස්වීමේ දී කිරීමට නියමිත කාර්යයන් කවරේදැයි එහි සඳහන් විය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීමක් කැඳවන ලෙස අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකු අත්සන් කර ඉදිරිපත් කරන ලිපියක් මගින් ඉල්ලා සිටියහොත් සභාපතිවරයා විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

මණ්ඩල රැස්වීම් සඳහා ගණපූරණය.

15. මණ්ඩල රැස්වීමක් පැවැත්වීම සඳහා ගණපූරණය, මුලසුන දරන සභාපතිවරයා ඇතුළුව තිදෙනෙකු විය යුතුය.

මණ්ඩල රැස්වීම් පරිපාටිය.

16. මණ්ඩල රැස්වීම් පැවැත්වීම හා එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිණිස මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධාන වලට යටත්ව මණ්ඩලය විසින් සිය කාර්යය පරිපාටිය සකස් කර ගත හැකිය.

මණ්ඩලයේ ලේකම්.

17. අධිකාරියේ කාර්ය මණ්ඩලයේ සුදුසු අයකු මණ්ඩලයේ ලේකම් වශයෙන් පත් කර ගැනීමට මණ්ඩලයට බලය තිබේ.

මණ්ඩලයේ පුරප්පාඩු නිසා එහි කටයුතු බලරහිත නොවන බව.

18. මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයෙකු පත් කිරීම දෝෂ සහිත වීම යන හේතු නිසා ම පමණක් මණ්ඩලයේ යම්කිසි ක්‍රියාවක් හෝ ක්‍රියාවලියක් හෝ බලරහිත නොවන්නේ ය.

මණ්ඩල සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

19. වයඹ පළාතේ පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට හා ප්‍රමාණවලට අනුකූලව මණ්ඩල සාමාජිකයින්ට අධිකාරියෙන් පාරිශ්‍රමික ලැබීමට හිමිකම් තිබිය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව.

20. (1) අධිකාරියේ පොදු මුද්‍රාව කලින් කලට මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අයෙකුගේ බාරයේ තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරියේ දී හැරෙන්නට අධිකාරියේ මුද්‍රාව සාධන පත්‍රයක හෝ ලියවිල්ලක හෝ නො යෙදිය යුතු අතර, අදාල මණ්ඩල සාමාජිකයින් දෙදෙනා ඔවුන් එම අවස්ථාවේ එහි සිටි බවට සළකුණක් වශයෙන් එම සාධන පත්‍රයෙහි නැතහොත් ලියවිල්ලෙහි තම අත්සන යෙදිය යුතු ය.

(3) අධිකාරයේ මුද්‍රාව යොදන ලද සාධන පත්‍ර හෝ ලියවිලි හෝ පිළිබඳ ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වා ගත යුතු ය.

මණ්ඩලයට දෙනු ලබන විධාන.

21. සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා වගකීම් ඉටු කිරීමේ දී අමාත්‍යවරයා විසින් කලින් කලට නිකුත් කරනු ලබන පොදු හෝ නිශ්චිත නියමයනට මණ්ඩලය යටත් වෙනවා මෙන් ම එම නියමයන්ට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

## III වැනි කොටස

## කාර්ය මණ්ඩල

අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරී.

22. (1) අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි ලෙස යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ ප්‍රවීණත්වයක් ඇති පුද්ගලයෙකු කළමනාකාර අධ්‍යක්‍ෂ ලෙස මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) ඉහත (1) වැනි උප වගන්තිය යටතේ පත් කරනු ලබන කළමනාකාර අධ්‍යක්‍ෂයේ පාරිශ්‍රමිකය අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අධිකාරිය විසින් ගෙවිය යුතු ය.

කළමනාකාර අධ්‍යක්‍ෂගේ බලතල හා රාජකාරි.

23. අධිකාරියේ එදිනෙදා පරිපාලන හා විනය පාලනය සම්බන්ධයෙන් කළමනාකාර අධ්‍යක්‍ෂ මණ්ඩලයට වගකිව යුතු අතර, ඔහු විසින් මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානවලට යටත්ව —

(අ) අධිකාරියේ සේවයේ යොදවාගෙන ඇති සේවකයින්ගේ කුශලතා වර්ධනය වැඩි දියුණු කිරීම ;

(ආ) අධිකාරියේ කාර්යය සාධනය වැඩි දියුණු කිරීම ;

(ඇ) අධිකාරියේ අරමුණු සපුරාගැනීම පිණිස අවශ්‍ය වන්නා වූ සේවාවන් සපයා ගැනීම;

(ඈ) කාර්ය මණ්ඩලයේ විනය පවත්වා ගැනීම ;

(ඉ) මණ්ඩලය විසින් පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම හා රාජකාරි ඉටු කරවා ගැනීම ;

කළ යුතු වේ.

අධිකාරියේ කාර්ය මණ්ඩලය.

24. මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව හා මණ්ඩලයේ අනුමැතිය මත කළමනාකාර අධ්‍යක්‍ෂක විසින් —

(අ) අධිකාරියේ සේවකයන් පත් කිරීම හා සේවයෙන් පහ කිරීම ;

(ආ) එම කාර්ය මණ්ඩලයේ වැටුප්, වේතන හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) එම කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි නියම කිරීම කළ හැක.

රජයේ නිලධාරීන් හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත්කිරීම හා ධූර දැරීම අවසන් වීම.

25. (1) අමාත්‍යවරයාගේ ඉල්ලීම මත පළාත් රාජ්‍ය සේවයේ කවර නිලධාරියකු හෝ නිලධාරීන් අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුකාරවරයාගේ හෝ ඔහු වෙනුවෙන් කටයුතු කිරීමට බලය පැවරී ඇති අයෙකුගේ එකඟත්වය ඇතිව අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව හෝ පත් කළ හැකි ය.

(2) රාජ්‍ය ප්‍රතිපත්ති තීරණයක් අනුව අධිකාරියේ සේවය අහෝසි කිරීමේ හේතුවෙන් අධිකාරියේ කාර්ය මණ්ඩල සේවයේ සාමාජිකයෙකු විසින් ධූර දැරීම අවසන් වුවහොත් ඔහු යථා යෝග්‍ය පරිදි (1) වැනි උප වගන්තිය යටතේ පත් කරනු ලැබුවෙක් නම් ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වයට හානියක් නොවන පරිදි කලින් දැරූ තනතුරකට හෝ වෙනත් තනතුරකට හෝ පත් කරනු ලැබීමට හෝ තනතුර අහෝසි වීමේ පදනම මත විශ්‍රාම ගන්වනු ලැබීමට හෝ ඔහුට හිමිකම් තිබිය යුත්තේ ය.

## IV වැනි කොටස

## මුදල් හා ගිණුම්

අධිකාරියේ අරමුදල.

26. අධිකාරියේ අරමුදලක් තිබිය යුතුය. එම අරමුදල පළාත් අරමුදලේ වෙනම ගිණුමක් විය යුතු අතර, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ III කොටසේ විධිවිධාන එම අරමුදල කෙරෙහි බල පෑ යුතු ය:

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පළාත් සභාව විසින් කලින් කලට සම්මත කරනු ලබන මුදල් ;

(ආ) අධිකාරියට පැවරී ඇති බලතල, කාර්යයන් හා වගකීම් ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී හෝ කාර්යය සාධනයේ දී අධිකාරියට ලැබෙන මුදල් ; හා

(ඇ) වෙනත් ආකාරයන්ගෙන් ලැබෙන මුදල්

අධිකාරියේ අරමුදලට බැර කළ යුතු ය.

අරමුදලින් වියදම් දැරීම.

27. අධිකාරියේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ කාර්යය පිණිස හෝ මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ පැවරී ඇති බලතල, කාර්යයන්, වගකීම් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කාර්යය සාධනයේ දී අරමුදල් යොද ගත හැකි ය.

අධිකාරියේ ගිණුම්.

28. එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් සිය ආදායම් හා වියදම් පිළිබඳවත්, වෙනත් සියළු ගණුදෙනු පිළිබඳවත් නිසි පරිදි ගිණුම් තැබීමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු අතර, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට තීරණය කරනු ලබන තොරතුරු ඇතුළත් කොට සිය අධිකාරියට අදාළව ගිණුම් හා සංඛ්‍යාලේඛන ඇතුළත් වාර්ෂික ප්‍රකාශයක් පිළියෙල කළ යුතු ය.

**අධිකාරියේ මුදල් වර්ෂය.**

29. අධිකාරියේ මුදල් වර්ෂය ජනවාරි මස 01 වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වේ.

**අධිකාරියේ විගණනය.**

30. (1) මුදල් වර්ෂය අවසාන වී මාස 06ක් ඉකුත් වීමට මත්තෙන් ඒ මුදල් වර්ෂය වෙනුවෙන් අධිකාරියේ ගිණුම් විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු අතර, එකී ගිණුම් විගණනයට ඔහුට සහාය වීම සඳහා විගණකාධිපති විසින් ඔහුගේ මග පෙන්වීම හා පාලනය යටතේ ක්‍රියා කරන නිසි සුදුසුකම් ලත් කවර හෝ විගණකවරයෙකුගේ හෝ විගණකවරුන්ගේ හෝ සේවය යොද ගත හැක්කේ ය.

(2) අධිකාරියේ ගිණුම් විගණනය සඳහා ඔහු විසින් දරන ලද වියදම් පියවා ගැනීම පිණිස අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයන් එවැනි විගණනයන් සඳහා ඔහු විසින් නිසි විගණකවරයෙකුට ගෙවිය යුතු මුදලක් වෙතොත් එය අඩු කොට ඉතිරිය ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

(3) විගණකාධිපතිට හෝ අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සඳහා ඔහුට සහාය වන යම් අයෙකුට හෝ එම විගණනයේ කාර්යයන් සඳහා අවශ්‍ය වන පොත්පත්, ඔප්පු, තිරප්පු, කොන්ත්‍රාත්තු, ගිණුම්, වවුචර් හා වෙනත් ලියවිලි ලබාගැනීමට හැකි විය යුතු අතර, එවැනි කාර්යයන් සඳහා තමන්ගේ දැනුම ඇතුළත් වන කවර හෝ තොරතුරක් මණ්ඩලය හෝ එහි නිලධාරීන් හෝ විසින් සැපයිය යුතු ය.

(4) මෙම වගන්තියේ සුදුසුකම් ලත් විගණකවරයා යනුවෙන් අදහස් වනුයේ —

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු වූ ද, ඒ ආයතනයෙන් සභාව විසින් ගණකාධිකාරීවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් වරලත් ගණකාධිකාරී සමාගමක එක් එක් හවුල්කරු ඒ ආයතනයේ සාමාජිකයෙකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනය, සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් වේ.

**විගණන වාර්තාව.**

31. විගණකාධිපති විසින් අධිකාරියේ ගිණුම් පරීක්ෂා කොට පහත සඳහන් කරුණු අඩංගු වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. එනම් –

(අ) තමන්ට අවශ්‍ය වූ සියළු තොරතුරු සහ පැහැදිළි කිරීම් ලැබුණේ ද නැද්ද යන වග ;

(ආ) අධිකාරියේ කටයුතු පිළිබඳ නිවැරදි හා සාධාරණ තීරණ ලබා ගැනීමට හැකිවන පරිදි වාර්තාවේ සඳහන් ගිණුම් නිසියාකාරව සකස් කර තිබෙන්නේ ද යන වග ;

(ඇ) තමාගේ හැඟීම් අනුව පළාත් සභාවට වැදගත් වන්නා වූ ගිණුම්වල අඩංගු යම් කරුණු හෝ අධිකාරියේ කටයුතු හා ගිණුම් පිළිබඳව පරීක්ෂණයේ දී හෙළි වූ වැදගත් කරුණු ද වේ.

**විගණන වාර්තාව හා කාර්යංශයේ වැඩ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව අමාත්‍යවරයාට යැවිය යුතු බව.**

32. විගණනය කරන ලද ගිණුම් හා විගණකගේ වාර්තාව එක් එක් වර්ෂයේ දී ලැබුණු විට එම වාර්තාවට අදළ මුදල් වර්ෂය තුළදී අධිකාරිය විසින් කරන ලද කටයුතු පිළිබඳ වාර්තාවක් ද සමඟ අදළ ලියවිලි අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළයුතු අතර, ඔහු විසින් එම ගිණුම්වලට අදළ මුදල් වර්ෂය ඉකුත් වී දෙළොස් මසක් ඉකුත් වීමට පළමුව ඒවායේ පිටපත් අමාත්‍ය මණ්ඩලයට හා පළාත් සභාවට ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතුය.

## V වැනි කොටස

## පොදු කරුණු

**නියෝග.**

33. (1) මෙම ප්‍රඥප්තියේ සිද්ධාන්ත හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා නියම කළයුතු යැයි නැතහොත් නීති පැනවිය යුතු යැයි මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති යම් කරුණක් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග පැනවිය හැකි වේ.

(2) අමාත්‍යවරයා විසින් පනවනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකළයුතු අතර, එය පළ වූ දිනයේ සිට හෝ එම නියෝගයේ සඳහන් දිනක හෝ ඊට පසු දිනක සිට හෝ ක්‍රියාත්මක වේ.

(3) අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝග ගැසට් පත්‍රයේ පළවීමෙන් පසු හැකිතාක් ඉක්මනින් එවා අනුමැතිය සඳහා පළාත් සභාව ඉදිරියේ තැබිය යුතු ය. එමෙන්ම ඒ අයුරින් අනුමත කරනු නොලැබූ නියෝග වෙතොත් එය අනුමත

කරනු ලැබූ දින සිට වලංගු කළා සේ සැළකිය යුතු වූවත්, එම නියෝග යටතේ ගනු ලැබූ කවර හෝ ක්‍රියා මාර්ගයක් කෙරෙහි එම අවලංගු වීම බල නොපෑ යුතු අතර, අමාත්‍යවරයා විසින් සාදනු ලද යම් නියෝග මේ අනුව අවලංගු වූවා සේ සැලකිය යුත්තේ කවර දිනක සිට ද යන්න දැන්වීමක් මගින් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

34. රීති සෑදිය යුතු යැයි බලය දෙන ලද හෝ මෙම ප්‍රඥප්තිය මගින් නියම කර ඇති හෝ කරුණුවලට අදාළව මණ්ඩලයට රීති සම්පාදනය කළ හැකි අතර, මණ්ඩලය විසින් සම්පාදනය කරන ලද කවර හෝ රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරන තුරු බල රහිත විය යුතුය. රීති.

35. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද අධිකාරියේ සියළු සාමාජිකයන්, නිලධාරීන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යයන් උදෙසා රාජ්‍ය සේවකයන් ලෙස පිළිගනු ලබන්නේය. අධිකාරියේ සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සැලකීම.

36. අමාත්‍යවරයාට හෝ සිය රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා නැතහොත් වගකීම් දැරීම සඳහා අවශ්‍ය වූ විට හෝ අධිකරණයක් ඉදිරියේ එසේ කිරීමට සිදු වූ විට හෝ යම් නීතියකින් අවශ්‍ය වූ විට හෝ හැරෙන්නට තම රාජකාරී ඉටු කිරීමේ දී නැතහොත් වගකීම් දැරීමේ දී හෝ තමන්ට ලැබෙන කිසිම තොරතුරක් මණ්ඩලයේ සාමාජිකයෙකු විසින් හෝ අධිකාරියේ යම් සේවකයෙකු විසින් හෝ හෙළි නො කළ යුතු ය. රහස්‍යභාවය.

37. මෙම ප්‍රඥප්තිය යටතේ සද්භාවයෙන් කරනු ලබන ක්‍රියාවන් සම්බන්ධයෙන් මණ්ඩල සාමාජිකයන්ට නැතහොත් අධිකාරියේ අවශේෂ නිලධාරීන්ට හෝ සේවකයන්ට හෝ විරුද්ධව නඩු පැවරීමක් හෝ නීති කෘත්‍යයක් හෝ ආරම්භ කොට පවත්වාගෙන යාම නොකළ යුතු ය. මෙම ප්‍රඥප්තිය යටතේ කටයුතු සඳහා ආරක්ෂාව.

38. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ පාඨවල යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨ බල පැවැත්වේ. අනනුකූලතාවය.

39. මෙම ප්‍රඥප්තියේ අන්‍යාකාරයෙන් දක්වා නැති නම් – අර්ථ නිරූපනය.

'අමාත්‍යවරයා' යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ යන්ත්‍රෝපකරණ අධිකාරිය භාර අමාත්‍යවරයා ද ;
'ආණ්ඩුකාරවරයා' යන්නෙන් වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා ද ;
'පළාත් සභාව' යන්නෙන් වයඹ පළාත් සභාව ද ;
'අමාත්‍යාංශය' යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ යන්ත්‍රෝපකරණ අධිකාරිය භාර පළාත් අමාත්‍යාංශය ද ;
'ගැසට් පත්‍රය' යන්නෙන් ආණ්ඩුවේ ගැසට් පත්‍රය ද ;

අදහස් වන්නේ ය.

11-99/2